සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

**8 ශ්‍රේණිය** | **නාට්‍ය හා රංග කලාව** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:

## I - කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **පහත දැක්වෙන සංවාද හා පද්‍ය කාණ්ඩ ඇසුරින් අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A ඇහැළ මලින් ගස් පිරිලා
බලන්න හරි ලස්සනයි

B හා හා දරුවනේ
යන්ට එපා දරුවනේ
අදට කැවුම් කාපල්ලා

C මෙහෙ කවුරුත් මැරෙන්නෙ නෑ
මෙහෙ ඉන්න අය අමරණීයයි

D අද වෙස්සන්තර රාජ පුතා
මන්ද්‍රි කුමාරි බඳී .......

E සෝබාවදේ මෙපුර
සිරි විසිතුරු බලනු මිතුරු

01. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර නිර්මාණය කළ නාට්‍යයකට අයත් ගීතයකි.
(1) A (2) B (3) C (4) D

02. නරිබෑණා නාට්‍යයට අයත් ගීතය දැක්වෙන අක්ෂරය වන්නේ,
(1) D (2) C (3) A (4) B

03. C අක්ෂරය අයත් නාට්‍ය වන්නේ,
(1) නෙලුම් කුමාරි ය. (2) අමර ගියා දිව්‍ය ලෝකේ ය.
(3) පුංචි අපට දැන් තේරෙයි ය. (4) හිම කුමාරි ය.

04. ''තාරාවෝ ඉගිලෙති'' නාට්‍යයට අයත් ගීතය දැක්වෙන අක්ෂරය වන්නේ,
(1) B (2) C (3) D (4) E

05. සෝමලතා සුබසිංහ විසින් නිෂ්පාදනය කළ නාට්‍යයකට අයත් අක්ෂරය වන්නේ,
(1) C (2) B (3) A (4) D

- **නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

(රංග විධාන, සමාරෝපය, නාට්‍යමය අත්දැකීම්, අංගරචනය, අධ්‍යක්ෂකවරයා)

06. ................................................................................. තම ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා දායක කර ගනී.

07. ................................................................................................................... යනු චරිතයක වෙස් ගැන්වීමයි.

08. ............................................................................................... නාට්‍ය පෙළක තිබිය යුතු අත්‍යාවශ්‍ය අංකයකි.

09. .............................................................................................................. නාට්‍ය පෙළ රංගයක් බවට පත්කරයි.

10. ......................................................................................................................... ආහාර්ය අභිනයට අයත් වේ.

• **අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට පහත වගුව ඇසුරු කරගෙන පිළිතුරු සපයන්න.**

| A | B | C | D |
|---|---|---|---|
| පෙළ රචකයා | අමර ගියා දිව්‍යලෝකේ | සංගීතය | කඳා වළලු |
| අධ්‍යක්ෂකවරයා | පුංචි අපට දැන් තේරෙයි | රංගාලෝකය | ලෝම හංස |
| නළු නිළියෝ | නෙලුම් කුමාරි | පසුතල නිර්මාණය | මහාසාර |
| ප්‍රේක්ෂකයෝ | හිම කුමාරි | වේෂභූෂණ | සඳ කිඳුරු |

11. නාට්‍යයක ප්‍රධාන පුද්ගලයේ දැක්වෙන තීරුව වන්නේ,
(1) D ය. (2) C ය. (3) B ය. (4) A ය.

12. ළමා නාට්‍ය ඇතුළත් තීරුව වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

13. ජාතක කතා ඇසුරින් නිර්මාණය වූ නාට්‍ය ඇතුළත් අක්ෂරය වන්නේ,
(1) B ය. (2) C ය. (3) D ය. (4) A ය.

14. අනුෂාංගික කලාවන් ඇතුළත් තීරුව වන්නේ,
(1) D ය. (2) C ය. (3) B ය. (4) A ය.

15. මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන් නිෂ්පාදනය කළ නාට්‍ය ඇතුළත් තීරුව වන්නේ,
(1) A ය. (2) D ය. (3) C ය. (4) B ය.

• **නිවැරදි පිළිතුර තෝරන්න.**

16. රූපණ කාර්යයේදී වඩාත් වැදගත්ම පුද්ගලයා වන්නේ,
(1) නළු නිළියන් ය. (2) පෙළ මතක් කර දෙන්නන් ය.
(3) අධ්‍යක්ෂකවරයා ය. (4) වේදිකා පාලකයා ය.

17. රංග ක්‍රීඩාවක් වන්නේ,
(1) රාක්ෂයෙක් ගමට ඇවිත් (2) හිම කන්ද දියවීම.
(3) සකස්කඩය කියවීම. (4) බැලූනය පිපිරීම.

18. නාට්‍ය අධ්‍යක්ෂකවරයෙකු නොවන්නේ,
(1) දයානන්ද ගුණවර්ධන ය. (2) සුගතපාල ද සිල්වා ය.
(3) පාලිත ලොකුපෝතාගම ය. (4) මාර්ටින් වික්‍රමසිංහ ය.

19. චරිත සඳහා නළු නිළියන් තේරීම හඳුන්වන්නේ,
(1) රූපණය යනුවෙනි. (2) අභිනය යනුවෙනි.
(3) නළුවරණය යනුවෙනි. (4) අනුකරණය යනුවෙනි.

20. මුහුනෙහි පිළිඹිබු වන හැඟීම් ප්‍රකාශන මගින් අදහස් දැක්වීම හඳුන්වන්නේ,
(1) ආංගික අභිනය යනුවෙනි. (2) වාචික අභිනය යනුවෙනි.
(3) සාත්වික අභිනය යනුවෙනි. (4) ආහාර්ය අභිනය යනුවෙනි.

## II - කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03 ට පිළිතුරු සපයන්න.**
- **පහත දැක්වෙන සංවාද කාණ්ඩය ඇසුරු කරගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01 ''මම මේ මහා මූකලානේ එහා ගම්මානේ.

මමයි ආච්චියි විතරයි ගෙදර ඉන්නේ...''

(1) ඉහත සංවාද කාණ්ඩය අයත් නාට්‍යයේ නම කුමක්ද? (ලකුණු 02)

(2) එහි අධ්‍යක්ෂකවරයා කවුද? (ලකුණු 02)

(3) මෙම නාට්‍යයේ ප්‍රධාන චරිත දෙක නම් කරන්න. (ලකුණු 02)

(4) මෙම නාට්‍යයෙන් ඔබට ගත හැකි ආදර්ශ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(5) නාට්‍ය අවසන් වන ආකාරය ලියා දක්වන්න. (ලකුණු 02)

02 (1) නාට්‍යයක වේෂභූෂණ යනු මොනවාද? (ලකුණු 02)

(2) වේෂභූෂණ නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු කරුණු 02 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

(3) රජකෙනෙකුගේ හෝ රජ බිසවකගේ රූපයක් ඇඳ ඔවුනට සුදුසු වේෂභූෂණ ඇඳ වර්ණ ගන්වන්න. (ලකුණු 04)

03 (1) නළු වරණය සිදුකරනු ලබන්නේ කවුරුන් විසින් ද? (ලකුණු 02)

(2) නළුවරණයේදී සැලකිලිමත් වන කරුණු 02 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

(3) ''නළුවරණය'' සිදුකරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

04 (1) අභිනය යනු කුමක්ද? (ලකුණු 02)

(2) සතර අභිනය නම් කරන්න. (ලකුණු 04)

(3) ඉන් අභිනයන් දෙකක් පිළිබඳ නිදසුන් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 04)

05 පහත දැක්වෙන කතා සාරාංශය ඇසුරු කරගෙන නාට්‍යපෙළක් ලියා දක්වන්න.

''අමල් හා නිමල් එකම පන්තියේ ඉගෙන ගන්නා යහළුවන් ය. දිනක් ඔවුන් පාසල නිම වී නිවසට යෑමට සූදානම්ව පාසලේ ගේට්ටුව අසලට පැමිණේ. එවිට එකවරම ගේට්ටුව ඉදිරිපිට වාහනයක් නතර කරයි. වාහනයෙන් බැස ඔවුන් ඉදිරියට පැමිණෙන පුද්ගලයා දැක ....

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

8 ශ්‍රේණිය | නාට්‍ය හා රංග කලාව

## ප්‍රායෝගික පරීක්ෂණය

01 මාෂා සහ වළහා නාට්‍යයේ ඔබ කැමති කොටසක් රංගනය කරන්න. (ලකුණු 10)

02 ඔබ කැමති නාට්‍ය ගීතයක් ගායනය හා රංගනය සමග ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

03 පහත චරිත උපයෝගි කරගනිමින් චරිත නිරූපණයේ යෙදෙන්න.

- ගායකයා / ගායිකාව
- නිරූපණ ශිල්පියා / නිරූපණ ශිල්පිණිය
- ක්‍රිකට් ක්‍රීඩකයෙක්
- යාචකයෙක්
- කපුමහතා / කපුමහත්මිය (ලකුණු 10)

04 විවිධ අරුත් උච්චාරණය වන සේ පහත වචන උච්චාරණය කරන්න. (ගුරු අභිමතය පරිදි යොදා වචන යොදා ගත හැකිය.)

- හරිම මහන්සියි
- හෙට එන්නම්
- මට පුළුවන් (ලකුණු 10)

05 සිසුන් 08 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් තුළින් කණ්ඩායම් නාට්‍ය ඉදිරිපත් කරන්න.

(ලකුණු 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

01 4 02 3 03 2 04 4 05 2 06 නාට්‍යමය අත්දැකීම්
07 සමරෝපයයි 08 රංගවිධාන 09 අධ්‍යක්ෂකවරයා 10 අංගරචනය
11 4 12 2 13 3 14 2 15 2
16 නළු නිළියන් ය. 17 රාක්ෂයෙක් ගමට ඇවිත්. 18 මාර්ටින් වික්‍රමසිංහ
19 නළුවරණය 20 සාත්වික අභිනය (20 × 2 = 20)

## II කොටස

01 (i) මාෂා හා වලහා (ලකුණු 02)
(ii) ඩී. කුමාරගේ මහතා (ලකුණු 02)
(iii) මාෂා හා වලහා (ලකුණු 02)
(iv) කීකරුබව, වරද පිළිගැනීම / අවස්ථාවෝචිත කටයුතු කිරීම / උපක්‍රමශීලීබව (ලකුණු 02)
(v) නාට්‍යය අවසන් ආකාරය විස්තරාත්මකව ලියා ඇත්නම් මුළු ලකුණු දෙන්න. (ලකුණු 02)

02 (i) නාට්‍යයක රඟදක්වන නළු නිළියන් විසින් අඳින පළඳින රංගවස්ත්‍රාභරණයි. (ලකුණු 02)
(ii)
- නාට්‍යයේ ශෛලිය
- චරිතවල ස්වභාවය
- නාට්‍යයේ කාලයට, දේශයට, යුගයට ගැලපෙන ලෙස තිබීම.
- නළු නිළියන්ට පහසුවෙන් ඇඳ පැළඳ ගැනීමට හැකි වන ලෙස නිර්මාණය කිරීම.

කරුණු 02 ක් ලියා තිබීම. (ලකුණු 04)

(iii) රජකෙනෙකු හෝ රජ බිසවකගේ රූපයක් ඇඳ ඔවුනට ගැලපෙන ලෙස අඳුම් පැළඳුම් අන්දවා වර්ණ ගන්වා තිබේ නම් මුළු ලකුණු ලබා දෙන්න. (ලකුණු 04)

03 (i) නාට්‍ය අධ්‍යක්ෂකවරයා විසිනි. (ලකුණු 02)
(ii) චරිතවල අභ්‍යන්තර ලක්ෂණ හා චරිතවල බාහිර ලක්ෂණ (ලකුණු 04)
(iii)
- ක්ෂණික නිරූපණය කිරීමට අවස්ථාව ලබාදීම.
- නාට්‍ය පෙළෙහි නාට්‍යෝචිත අවස්ථාවක් රඟ දැක්වීමට අවස්ථාව සැලසීම.
- නාට්‍යයේ චරිතවලට උචිත යන්න විමසා බැලීම.
- බාහිර ලක්ෂණයෙන් චරිතයට උචිත ලෙස නළුවා තෝරා ගැනීම.
- ගීතයක් හෝ නර්තනයක් කිරීමට අවස්ථාව සලසා දීම ආදී ලියා තිබේනම් ලකුණු ලබා දෙන්න.

(ලකුණු 04)

04 (i) ඉදිරියට ගෙන යැමයි. (ලකුණු 02)
(ii) ආංගික අභිනය
වාචික අභිනය
සාත්වික අභිනය
ආහාර්ය අභිනය (ලකුණු 04)
(iii) නිදසුන් දක්වා විස්තර කිරීමට $3 \times 2 = 6$ (ලකුණු 06)

05 සංවාද, දෙබස්, රංගවිධාන තිබීම. (ලකුණු 04)
නාට්‍යෝචිතබව, නිර්මාණශීලීබව, අපූර්වත්වය (ලකුණු 06)